# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1658/36 - 2010 ජුනි මස 17 වැනි බ්‍රහස්පතින්දා - 2010.06.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. – බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන අමාත්‍ය, දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බන්ඩා දිසානායක වන මම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත මේ නියමය මගින් (2009 මැයි මස 29 වැනි දින අංක 1603/49 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මගින් අවසන් වරට සංශෝධිත ) එකී පනතේ 139 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, ඉහත කී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමයක් ලෙස සලකනු ලැබිය යුතු සහ කොළඹ විශ්ව විද්‍යාලය පිහිටුවනු ලැබූ නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ (පීඨය) දැක්වෙන "ශාස්ත්‍ර පීඨය " යන අයිතමයට අනුරූපව එම උපලේඛනයේ II වැනි තීරයේ දැක්වෙන සියලු අයිතම ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන අයිතම ආදේශ කිරීමෙන් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ. :—

"උපලේඛනය

| *I වැනි තීරය* **පීඨය** | *II වැනි තීරය* **අධ්‍යයන අංශ** |
|---|---|
| ශාස්ත්‍ර පීඨය | 1. ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය |
| | 2. ඉංග්‍රීසි අධ්‍යයන අංශය |
| | 3. භූගෝල විද්‍යා අධ්‍යයන අංශය |
| | 4. ප්‍රජා විද්‍යා අධ්‍යයන අංශය |
| | 5. ඉතිහාසය අධ්‍යයන අංශය |
| | 6. ජාත්‍යන්තර සම්බන්ධතා අධ්‍යයන අංශය |
| | 7. දේශපාලන විද්‍යාව හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයන අංශය |
| | 8. සිංහල අධ්‍යයන අංශය |
| | 9. සමාජ විද්‍යා අධ්‍යයන අංශය.". |

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බන්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2010 ජුනි මස 08 වැනි දින,
කොළඹ,
උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

07-137/1

1A - G 13001—835 (2010/06)